## Abstract

The five way mechanism or five "S" concept regarding productivity was first launched in Japan. This concept was popularized to enhance the productivity of management after it was implemented in Japan. The five "S" concept utilized, Team spirit real management system, participatory management and leadership development and with the help of them the linker liaison between the top level and low level has developed. As a result the suggestions and views of everyone was considered to uplift the managemen and productivity. Therefore it has been proved that very strong and stable institutions were established with the help of everyone's contribution.

The five "S" concept was introduce to Sri Lanka in a era where there was relative progress, in education system with insufficient condition of quality of the education and along with that a lot of discussions were going on regarding the empowerment of schools. As a consequence of that five "S" can be regarded as one of the mechanisms to develop the productivity of school system.

According to that so many schools implemented this productivity concepl and it can be seen that they were able to reach the productivity to some extent. Every year these schools were evaluated and were awarded at the productivity awards ceremony organized and canducted by national productivity secretariat under the guidance of minisitry of national manpower and technology.

There fore this research text was prepared after studying the main concept of these schools. To convince that the following main four objectives were analysed in those productivity wining schools. (i) How the school planned to carry out the productivity system (ii) How it has been implement. (iii) The contribution given by the school partners. (iv) What type of stratagie were taken up to develop the quality of students education and social skills.

Under sample survey system a real sample research was selected to this process representing twelve national schools that won the national productivity award, and six schools from both gall and matara districts were chosen for this sample observation. When obtalning data triangular mechanisum was used and as the first tool to collect data, observation system, questionnal and report analysis were carried out.

According to the analysis of statisties, percentages, diagrams, and charts of those sample schools out of five "S" concept seithon, Seire and seiso could be seen in very high level whereas seikothsu and shithsuki were in a low level. A sfricking change of the physical environment was seen in those award winning schools, but in comparison no specific progress was vividly seen on human resources.

The award wining year has shown some improvement of the school development as many parents were involved in school activities. This indicates the results in high progress. After the award wining year there was a slight deerease of the results in the schools. For this survey Matara and Galle districts were analyzed. There was a big improvement of five "S" concepet in Matara district rather than in Galle district.

According to the survey practicability of five "S" concept was high in urban schools when compaired to the other schools that have A/L were in high rank in practicing five "S" concept.

More over the qualities of the leadership had high impact in upqrading this concept.

Smoth flow of the management from bottom to top was seen in this regard. The upliftment of physical and membership development this five "S" concept was highly applicable and rewarding task.

## සංක්ෂිප්තය


ඵලදායිතාවය පිළිබඳ පංචවිධ සංකල්පය හෙවත් එස් පහ (S5) සංකල්පය ජපානයේ උපත ලද්දක් වේ. මෙම සංකල්පය ජපානයේ හඳුන්වා දීමට පෙර බොහෝ දෙනා එම සංකල්පයේ අන්තර්ගතය ක්‍රියා පිළිවෙත් දැන හෝ නොදැන අතීතයේ සිට ක්‍රියාත්මක කොට ඇත. නමුත් මෙය කළමනාකරණයේ දී ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා උපක්‍රමයක් ලෙස ප්‍රචලිත වූයේ ජපානයේ ක්‍රියාත්මක වීමෙන් අනතුරුවය.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව ශීඝ්‍ර කාර්මික දියුණුවක් කරා ගමන් කළ අතර සෑම විටම ජපානයේ කර්මාන්ත ශාලා, පාසල්, රජයේ ආයතන යන සියල්ලම උසස් තත්ත්වය ඉලක්ක කර ගත් කළමනාකරණය අනුගමනය කරන ලදී. මේ සඳහා කණ්ඩායම් හැගීම, නිවැරදි කළමනාකරණ ක්‍රමය, සහභාගීත්ව කළමනාකරණය, නායකත්ව වර්ධනය ආදී ශිල්ප ක්‍රම සියල්ලම යොදා ගත් අතර ඒ සියලුදේම පහසු කරලීම සඳහා පහසු කාරකයක් ලෙස එස් පහ පංචවිධ සංකල්පය භාවිතා කර ඇත. විශේෂයෙන්ම එස් පහ සංකල්පය ක්‍රියාත්මක කිරීම තුළින් ඉහළ හා පහළ සේවක සම්බන්ධතාවය වර්ධනය වූ අතර ආයතනයේ කළමනාකරණය හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සෑම දෙනාගේම අදහස්, යෝජනා, කැපවීම ලබා ගැනිමට හැකි විය. ඒ නිසාම සියලු දෙනාගේම දායකත්වය මත ශක්තිමත් ආයතන නිර්මාණය කිරීමට හැකිවිය. මෙම හේතුව නිසාම කළමනාකරණ මට්ටම් වල තම ආයතන ඉතා පහසුවෙන් පරිපාලනය කළ හැකි විය. එමෙන්ම ඒ සඳහා යෙදවිය යුතු උත්සාහය, මහන්සිය, සව්මත්බව ඉතා අවම මට්ටමක විය.

මේ ආකාරයට ජපානය ශීඝ්‍ර දියුණුවක් කරා ගමන් කරනු දුටු ආසියාතික රටවල් ද මෙම සංකල්පය ක්‍රියාත්මක කර ප්‍රතිඵල ලබන්නට විය. රාජ්‍ය හා පෞද්ගලික ආයතන මෙන්ම පාසල් ද ජයග්‍රහනය කරන්නට විය. අනතුරුව ශ්‍රී ලංකාවේ ද මේ සඳහා යොමු වන්නට වීමේ ප්‍රතිඵලයක් ලෙස ජාතික ඵලදායිතා අමාත්‍යාංශය ගොඩනැගුණු අතර ඵලදායිතා දශකයක් ද හඳුන්වා දෙමින් පාසල් කරා ද එස් පහ සංකල්පය හඳුන්වා දෙනු ලැබීය. ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ සාපේක්ෂ වශයෙන් ප්‍රමාණාත්මක වර්ධනයක් සිදු වුව ද ගුණාත්මක තත්ත්වය පිළිබඳ ගැටළු රාශියක් පැන නැගී ඇති යුගයක එස් පහ සංකල්පය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස පාසල් ඵලදායීතාවය වර්ධනය කිරීමේ එක් ශිල්ප ක්‍රමයක් ලෙස එස් පහ සංකල්පය හඳුන්වා දිය හැකිය.

ඒ අනුව හඳුන්වා දෙනු ලැබූ ඵලදායිතා සංකල්පය බොහෝ පාසල් තුළ ක්‍රියාත්මක කරමින් ඵලදායීතාවය කරා ළගා වීමක් දක්නට ලැබුණු අතර වර්ෂයක් පාසා ජාතික මිනිස්බල හා තාක්ෂණ අමාත්‍යංශය යටතේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ඵලදායිතා සම්මාන උළෙලේ දී, එස් පහ සංකල්පය තුළින් ඵලදායිතාවය කරා ගමන් කරනු ලබන පාසල් තෝරා ඇගයීමක් කරනු ලැබීය. එම උළෙලේ සම්මාන ලාභී පාසල් තෝරා ගෙන කරනු ලැබූ මෙම අධ්‍යයනය තුළ,

නියැදියට අයත් පාසල් වල එස් පහ සංකල්පයට අයත් ප්‍රධාන සංකල්ප ක්‍රියාත්මක කිරීමට පාසල විසින් ගෙන ඇති වැඩ පිළිවෙල සැලසුම් කර ඇති ආකාරය විමසා බැලීම, එම සැලසුම් ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි විමසා බැලීම, මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් පාර්ශවකරුවන් ලබා දෙන දායකත්වය කෙබඳුදැයි විමසා බැලීම හා මෙම සංකල්පය තුළින් සිසුන්ගේ අධ්‍යාපන හා සමාජ කුසලතා වර්ධනයට ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාදැයි විමසා බැලීම යන ප්‍රධාන අරමුණු හතර පාදක කොට ගෙන ඵලදායිතා සම්මානයෙන් පිදුම් ලද පාසල් වල එස් පහ සංකල්පයේ ක්‍රියාකාරී මට්ටම කෙබඳුද යන තේමාව ඔස්සේ මෙම පර්යේෂණ කෘතිය සකස් කරනු ලැබීය.

මෙම අධ්‍යයනය සඳහා ඵලදායිතා සම්මාන ලාභී පාසල් තෝරාගනු ලැබූ අතර ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක නියෝජනය කරමින් 2009 වර්ෂයේ ජාතික ඵලදායිතා සම්මාන ලද පාසල් 12 ක් තෝරා ගනු ලැබූ අතර ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 6 ක් හා මාතර දිස්ත්‍රික්කයෙන් පාසල් 6 ක් නියැදිය ලෙස නිරීක්ෂණයට බඳුන් විය. නියැදිගත සෑම පාසලකින්ම විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති ඵලදායීතා කමිටුව නියෝජනය කරමින් ගුරුවරුන් දෙදෙනෙක්, සිසුන් දෙදෙනෙක්, දෙමාපියන් දෙදෙනෙක් මේ සඳහා නියැදිගත සාමාජිකයින් වූහ. දත්ත ලබා ගැනීමේ දී ත්‍රිකෝණී ක්‍රමය භාවිතා කරමින් නිරීක්ෂණ ක්‍රමය හා ප්‍රශ්නාවලි, වාර්තා විශ්ලේෂණ ක්‍රම භාවිත කරමින් දත්ත ලබාගනු ලැබීය.

මෙම කාර්යය සඳහා මග පෙන්වීමක් සාහිත්‍ය විමර්ශනය තුළින් ලැබුණු අතර අදාළ තේමාවට උචිත වූ පර්යේෂණ සාහිත්‍ය දේශිය හා විදේශිය වශයෙන් අල්ප වූ බැවින් ඵලදායී පාසල් සම්බන්ධ දෙස් විදෙස් පොත්පත් පරිශීලනය කිරීමට පර්යේෂකයාට සිදු වේ. විවිධ ක්‍රම ඔස්සේ ඵලදායිතාවය කරා ලගා වූ පාසල් බොහොමයක් වූ අතර ලංකාවේ වර්තමානයේ ප්‍රචලිත වූ ක්‍රමයක් ලෙස ජපන් එස් පහ සංකල්පය යොදා ගෙන ඵලදායිතාවය කරා ළගා වූ පාසල් පිළිබඳ අධ්‍යයනය කිරීමට පර්යේෂකයාට සිදු විය.

නියැදි සමීක්ෂණ ක්‍රමය යටතේ සහේතුක නියැදියක් පර්යේෂණ කාර්යය සඳහා තෝරා ගනු ලැබූ අතර නිරීක්ෂණ, ප්‍රශ්නාවලි, වාර්තා විශ්ලේෂණ යන ක්‍රම භාවිතා කරමින් දත්ත රැස් කරනු ලැබීය. ලබා ගත් දත්ත වගු, ප්‍රස්තාර හා රූප සටහන් ඇසුරින් සංඛ්‍යා ප්‍රතිශත ලෙස විශ්ලේෂණය හා අර්ථකථනය කර ඉදිරිපත් කරනු ලැබීය.

නියැදිගත පාසල් තුළ එස් පහ සංකල්පය අනුව සෙයිරි, සෙයිතෝන්, සෙයිසෝ යන සාධක තුන ඉතා ඉහළ මට්ටමින් ක්‍රියාත්මක වනු දක්නට ලැබුණු අතර සෙයිකෙත්සු හා ෂිත්සුකි සාධකයේ ක්‍රියාත්මක මට්ටම අවම අගයක් ගෙන තිබුණි. සම්මානලාභී පාසල් හි භෞතික පරිසරය තුළ කැපී පෙනෙන වෙනසක් සිදු වී තිබුණු අතර ඊට සාපේක්ෂව මානව සම්පතේ සුවිශේෂී වර්ධනයක් දක්නට නොලැබුණි. පාසලේ සංවර්ධනය උදෙසා ප්‍රජා සහභාගීත්වය ඉතා

ඉහළ අගයක් ගෙන තිබූ අතර සම්මානලාභී වර්ෂයේ විභාග ප්‍රතිඵල ද ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි. සම්මානලාභී වර්ෂයට සාපේක්ෂව පසු වර්ෂවල දී විභාග ප්‍රතිඵල ක්‍රමිකව පහළ යාමක් ද අනාවරණය විය. දිස්ත්‍රික්ක දෙකක් මේ සඳහා අධ්‍යයනයට පාත්‍ර වූ අතර ගාල්ල දිස්ත්‍රික්කයට වඩා මාතර දිස්ත්‍රික්කයේ එස් පහ සංකල්පයේ ඉතා ඉහළ ක්‍රියාත්මක මට්ටමක් පැවති බව ද අනාවරණය විය. පාසල් සංයුතිය අනුව නාගරික පාසල් තුළ එස් පහ ක්‍රමයේ ක්‍රියාත්මක මට්ටම ඉහළ අගයක් ගෙන තිබුණු අතර පාසල් වර්ගය අනුව අපොස (උ.පෙළ) දක්වා පන්ති පැවැත්වෙන පාසල් තුළ ඉහත සංකල්පය වඩාත් හොඳින් ක්‍රියාත්මක වනු දක්නට ලැබුණි. එසේම එස් පහ සංකල්පයේ සාර්ථකත්වය උදෙසා නායකත්වයේ සුවිශේෂී ලක්ෂණ වඩාත් බලපානු ලබන අතර බොහෝ පිරිසකගේ අඛණ්ඩ සහභාගීත්වය ඉතා වැදගත් බව නිගමනය කළ හැකි විය. කළමණාකාරීත්වය පහළ සිට ඉහළට ගලා යන ආකාරයේ බැඳීමක් සහිත දම්වැලක් සේ ක්‍රියාත්මක වීමක් ද වැදගත් අනාවරණයක් විය. කෙසේ නමුත් පාසලක භෞතික මෙන්ම සාමාජික වර්ධනය උදෙසා ඵලදායීතාවය වර්ධනය කර ගැනීමට සාර්ථක වූ මෙවලමක් ලෙස එස් පහ සංකල්පය පෙන්වා දිය හැකිය.